# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,491 - 2026 මැයි මස 29 සිකුරාදා - 2026.05.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| තනතුරු ඇබෑර්තු ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | 812 |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... | 818 |
| අතුරු ව්‍යවස්ථා ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... | — |
| දේපළ විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... | 819 |


**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට්* පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක්ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 ජූනි මස 19 දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 ජූනි මස 05 දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."

2026 අප්‍රේල් මස 02 දින,<br>කොළඹ 08,<br>රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**ප්‍රසන්න ජයරත්න,**<br>රජයේ මුද්‍රණාලයාධිපති.

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


811 - B 082797 — (2026/05)<br>F 1 -

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## කළුතර මහා නගර සභාව

### කළුතර මහා නගර සභාවේ ගිනි නිවීම් සේවා ඒකකයෙහි ගිනිභට තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කළුතර මහා නගර සභාවේ ගිනි නිවීම් සේවා ඒකකයෙහි පවතින ගිනිභට තනතුරු පුරප්පාඩු සඳහා පහත සඳහන් සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ :

1. තනතුර : ගිනිභට
2. පුරප්පාඩු සංඛ්‍යාව : 15
3. වැටුප් කේත අංකය : රා.ප.ච. 10/2025 අනුව RS 1- 2025
4. වැටුප් පරිමාණය : මෙම තනතුරට හිමි වැටුප් පරිමාණය රා.ප.ච. 10/2025 අනුව රු. 49,550-7x540-27x670- රු. 71,420 වේ.
5. සේවා ගණය : නියාමන සේවා
6. පත්කිරීම් බලධරයා : නාගරික කොමසාරිස්

7. **තනතුරෙහි ස්වභාවය :**

මෙම තනතුර ස්ථිරය.විශ්‍රාම වැටුප් සහිතය. තවද ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය.රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.ආධුනික ගිනිභටයින් ලෙස සේවයට ගෙන එක් අවුරුදු පුහුණු පාඨමාලාව සාර්ථකව අවසන් කරන ආධුනික ගිනිභටයින් ගිනිභට තනතුර සඳහා ස්ථිරවම බඳවා ගනු ලැබේ.

8. **කාර්යයභාරය :**

කළුතර මහා නගර සභාවේ නීතිවලට අනුකූලව තනතුරට අදාළව ගිනි සහ වෙනත් ආපදා අවස්ථාවලදී ජීවිත හා දේපළ බේරා ගැනීම සඳහා පවරනු ලබන කාර්යයන් හා තනතුරට අදාළව ආයතන ප්‍රධානී පවරනු ලබන රාජකාරි.

9. **අධ්‍යාපන සුදුසුකම් :**

එකවරකදී සිංහල/දෙමළ භාෂාව හා ගණිතය ඇතුළුව විෂයයන් හතරකට සම්මාන සාමාර්ථයන් සහිතව විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර(සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම හා එම අවස්ථාවේදීම හෝ තවත් එක් අතිරේක අවස්ථාවකදී විද්‍යාව හා ඉංග්‍රීසි භාෂාව විෂයයන් ද සමත්ව තිබිය යුතු ය.

10. **කායික සුදුසුකම් :**

I. උස සෙ.මී. 162 කට නොඅඩු සහ ජෛව ස්කන්ධ දර්ශකය නියමිත පරිදි තිබිය යුතුය.( ජෛව ස්කන්ධ දර්ශකය 18.5 සිට 24 දක්වා)

II. දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

III. දෘෂ්ටිය පිළිබඳ අවශ්‍යතාවයන් - උපැස් යුවලක් හෝ ස්පර්ශ කාච රහිතව ඇස් පෙනීම අවම වශයෙන් 6/6 සහ 6/12 අතර වර්ණ පෙනීම ද සාමාන්‍ය විය යුතුය.

IV. කෘත්‍රිම ශාරීරික වෙනස්කම් කර නොතිබිය යුතුය. (උදා. පච්ච කොටා තිබීම වැනි)

11. **වයස් සීමාව :**

අවම වයස් සීමාව අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර, උපරිම වයස් සීමාව අවුරුදු 24 ට නොවැඩි විය යුතු ය.

**12. වෙනත් :**

I. ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය

II. අයදුම්පත් කැඳවන අවසාන දිනට පූර්වාසන්න වසර 03ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවකු විය යුතුය

III. අවිවාහක පිරිමි අයකු විය යුතුය

IV. යහපත් චරිතයකින් යුක්ත විය යුතු අතර නීති විරෝධී ක්‍රියාවන්ට සම්බන්ධ නොවූ අයෙකු බව සනාථ කිරීමට පොලිස් වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය.

V. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය වන **2026.06.19** දිනට සෑම ආකාරයෙන්ම සපුරා තිබිය යුතුය.

**13. බඳවා ගැනීමේ ක්‍රමය :**

I. විවෘත බඳවා ගැනීම

II. ලිඛිත පරීක්ෂණයෙන් හා වෘත්තීය (ප්‍රායෝගික) පරීක්ෂණයෙන් ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව පුරප්පාඩු සඳහා ආධුනික ගිනි හටයින් වශයෙන් තෝරා ගනු ලැබේ.

III. පුහුණුව ආරම්භ කිරීමට පෙර සියලුම ආධුනික ගිනිහටයින් කායික,මානසික යෝග්‍යතාව තහවුරු කිරීම සඳහා වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබේ.

**13. (a) ලිඛිත විභාගය**

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *අවම සමත් ලකුණු* |
|---|---|---|---|
| සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40 |

**13. (b) ලිඛිත විභාගය සඳහා විෂය නිර්දේශය**

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය | ජාතික කලාපීය හා ලෝකයේ විවිධ සංවිධාන පරිසරයන් තුළ පවතින සමාජීය, සංස්කෘතික,අධ්‍යාපනික,විද්‍යාත්මක, දේශපාලනමය,ආර්ථික හා අනෙකුත් අදාළ සාධකයන් සම්බන්ධව මෙන්ම විද්‍යාත්මක හා කාර්මික සංවර්ධන සම්බන්ධයෙන් ඇති දැනුම,තර්කන ශක්තිය,ගණිත කුසලතාවයන්,තාර්කික තීරණ ගැනීම හා කාලය කළමනාකරණය කිරීම, පරීක්ෂා කිරීම සඳහා සකස් වූ ප්‍රශ්න පත්‍රයකි. |

**13. (c) වෘත්තීය (ප්‍රායෝගික) පරීක්ෂණය**

ලිඛිත විභාගයෙන් සමත් අයදුම්කරුවන් සඳහා වන ප්‍රායෝගික පරීක්ෂණ

| *විෂය ක්ෂේත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *අවම සමත් ලකුණු* |
|---|---|---|---|
| දරා ගැනීමේ හැකියාව | අදාළ වන පරිදි | 60 | 36 |
| සමබරතාව | අදාළ වන පරිදි | 40 | 24 |

**13.*(d)* වෘත්තීය පරීක්ෂණය සඳහා විෂය නිර්දේශය**

| *විෂය ක්ෂේත්‍රය* | *විෂය නිර්දේශය* |
|---|---|
| දරා ගැනීමේ හැකියාව | I. දිවීම (කිලෝමීටර් 01ක දුර දිවීමට ගතවන අවම කාලය අනුව ප්‍රමුඛතාවය)<br>II. ඩිප්ස් ගැසීම (නිවැරදිව ඩිප්ස් 25ක් ගැසීමට ගතවන අවම කාලය)<br>III. බර ඔසවාගෙන යාම |
| සමබරතාවය | i. ඉනිමගේ යාම<br>ii. කඹයෙන් බැසීම |

(මෙම පරීක්ෂණයට සහභාගී වීමට පෙර ශාරීරික යෝග්‍යතාවය පිළිබඳ රජයේ ලියාපදිංචි වෛද්‍යවරයකුගෙන් ලබා ගත් වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කළ යුතු වේ.)

**13. *(e)* සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය**

- මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා පවත්වනු ලැබේ.ලකුණු ලබා දෙනු නොලැබේ.

iv. පුරප්පාඩු සඳහා තෝරාගන්නා අයවලුන් එක් අවුරුදු ගිනිභට පුහුණු පාඨමාලාව හැදෑරිය යුතුය. පුහුණු කාලසීමාව තුළදී වැඩ හැසිරීම හා පැමිණීම සතුටුදායක නොවන හෝ අපේක්ෂිත රැකියා මට්ටමට ළඟා නොවන ආධුනික ගිනිභටයින් කිසිම වන්දියකින් තොරව පුහුණුවෙන් ඉවත් කරනු ලැබේ.

v. සාර්ථකව අදාළ පුහුණුව අවසන් කරන ආධුනික ගිනිභටයින් ගිනිභට තනතුරු සඳහා ස්ථිරව බඳවා ගනු ලැබේ. පුහුණු කාලසීමාව ස්ථිර සේවා කාලය සඳහා ගණනය කරනු ලබන අතර, අදාළ වැටුප් පරිමාණයේ දෙවන පියවරේ තබනු ලැබේ.

vi. පුහුණු කාලසීමාව තුළ මාසික ව රු.10,000.00 ක දීමනාවක් ගෙවනු ලැබේ.

vii. පුහුණු කාලසීමාව තුළදී කිසිම ආධුනික ගිනිභටයකුට විවාහ වීමට අවසර දෙනු නොලැබේ.

viii. පුහුණුවට තෝරාගන්නා ලද ආධුනික ගිනිභටයින් ස්ථිර තනතුරට පත්කිරීමෙන් අනතුරුව පත් කළ දින සිට වසර 05ක කාල සීමාවට අදාළව කළුතර මහා නගර සභාවේ සේවය කරන බවට පත්කිරීම් බලධරයා සමඟ රු.500,000.00 ක වටිනාකමකින් යුත් බැඳුම්කරයක් පුහුණුව ආරම්භ කරන අවස්ථාවේදී අත්සන් කළ යුතුය.

ix. පුහුණු කාලය අතරතුර පුහුණුවෙන් ඉවත් වන්නේනම් පුහුණුව සඳහා කළුතර මහා නගර සභාව විසින් දරන ලද සියලුම වියදම් ආයතනය වෙත ගෙවිය යුතුය.

x. ගිනිභට තනතුරු සඳහා පත්වීම් ලද පත්වීම්ලාභීන් කළුතර මහා නගර සභා බලප්‍රදේශය තුළ පදිංචි විය යුතු ලෙස නියම කළ හැකිය.

**14. අයදුම් කිරීමේ ක්‍රමය:**

I. නිවේදනයේ අග දක්වා ඇති ආදර්ශ ආකෘතියට අනුකූලව A4(සෙ.මී. 21 X සෙ.මී.29) ප්‍රමාණයේ කඩදාසියේ දෙපසම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත්‍රය සකස් කළ යුතුය.

II. සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය **2026.06.19** දින හෝ ඊට පෙර "නාගරික කොමසාරිස්,කළුතර මහා නගර සභාව, කළුතර " යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවර "කළුතර මහා නගර සභාව -ආධුනික ගිනිභට තනතුර සඳහා තෝරා ගැනීම - 2026 " යනුවෙන් සඳහන් කළ යුතුය.

III. දැනට රාජ්‍ය සේවයේ සිටින අයදුම්කරුවන්ගේ අයදුම්පත්‍ර අදාළ ආයතන ප්‍රධානියා මඟින් ඉදිරිපත් කළ යුතුය

IV. අදාළ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් හා නිවැරදිව හා පැහැදිලි අත් අකුරින් එවනු නොලබන හා අයදුම්පත්‍ර කැඳවනු ලබන අවසන් දිනට (2026.06.19) බඳවා ගැනීමේ මූලික සුදුසුකම් සපුරා නැති සහ දක්වා ඇති කොන්දේසිවලට අදාළ නොවන,අසම්පූර්ණ එමෙන් ම ප්‍රමාද වී ලැබෙන සහ සනාථ කිරීමේ ලියවිලි අමුණා නොමැති අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් තැපෑලෙන් නැතිවීම හා ප්‍රමාද වීම පිළිබඳව කළුතර මහා නගර සභාව වග කියනු නොලැබේ.

V. අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු/සාමදාන විනිශ්චයකරුවකු /ප්‍රසිද්ධ නොතාරිස්වරයකු/ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු/පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියකු හෝ රු.395,520.00 ක් හෝ ඊට වැඩි වාර්ෂික වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික නිලධාරියකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

VI. අයදුම්පත්‍රය සමග පහත සඳහන් ලියවිලිවල ඡායාපිටපත් අමුණා එවිය යුතුය.කිසියම් අයදුම්කරුවකු සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබූ විට එම සහතිකවල මුල් පිටපත් හා අනෙකුත් සහතික ඉදිරිපත් කිරීමට සූදානම්ව සිටිය යුතුය:

(අ) උප්පැන්න සහතිකය
(ආ) අධ්‍යාපන සහතික පිටපත්;
(ඇ) ජාතික හැඳුනුම්පතේ ඡායාපිටපත;
(ඈ) ග්‍රාම නිලධාරි සහතිකය;
(ඊ) පොලිස් සහතිකය;
(ඉ) වෛද්‍ය සහතික.

VII. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය **2026.06.19** දින වේ.

**15. විභාග මධ්‍යස්ථානය :**

මෙම විභාගය කළුතර නගරය තුළදී පැවැත්වීමට අපේක්ෂා කරනු ලැබේ. විභාගය ආරම්භ වන දිනයේ අයදුම්කරුවන් විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශපත්‍රය ඉදිරිපත් කළ යුතු වේ. විභාගය පැවැත්වෙන ස්ථානය ප්‍රවේශ පත්‍රය නිකුත් කිරීමේදී දැනුම් දෙනු ලැබේ.

**16. විභාග අපේක්ෂකයාගේ අනන්‍යතාවය තහවුරු කිරීම :**

තමා පෙනී සිටින විෂය සම්බන්ධයෙන් විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් අපේක්ෂකයකු විභාග ශාලාවේ දී තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතුය. මේ සඳහා පහත ලේඛන පමණක් පිළිගනු ඇත :-

(අ) පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති ජාතික හැඳුනුම්පත;
(ආ) ආගමන හා විගමන දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති වලංගු විදේශ ගමන් බලපත්‍රය;
(ඇ) මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කර ඇති වලංගු රියදුරු බලපත්‍රය.

**17. විභාගය පැවැත්වීම:**

(i) විභාගය සිංහල හා දෙමළ මාධ්‍යයෙන් පැවැත්වේ.
(ii) කළුතර මහා නගර සභාව විසින් විභාගය පවත්වනු ලැබේ.
(iii) මෙම විභාගය කල් දැමීම හෝ අවලංගු කිරීම හෝ පැවැත්වීමෙන් පසු තෝරා ගැනීම් කිරීම/නොකිරීම හෝ පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳ අවසාන තීරණය සහ මෙම දැන්වීමේ සඳහන් නොවන කරුණු පිළිබඳ තීරණ ගැනීමේ බලය කළුතර මහා නගර සභාවේ නාගරික කොමසාරිස් සතු වේ.
(iv) යම් අයදුම්කරුවකුට සුදුසුකම් නොමැති බව පුහුණුව/පත්වීම ලැබීමට පෙර හෝ පුහුණුව/පත්වීම ලැබීමට පසු ඕනෑම අවස්ථාවකදී අනාවරණය වුවහොත් අපේක්ෂකත්වය හෝ පත්වීම අවලංගු කෙරෙනු ඇත. එසේම දැන දැනම සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිවැරදි තොරතුරු ඕනෑකමින් යටපත් කර ඇති බව හෝ අනාවරණය වුවහොත් සේවයෙන් පහ කරනු ලැබේ.

**18. මෙම නිවේදනයේ සිංහල,දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවක් පවතී නම් සිංහල නිවේදනයේ ඇතුළත් කරුණු බලපවත්නේ ය.**

ඩී. එන්. පියුමාලි කුලරත්න,
නාගරික කොමසාරිස්,
කළුතර මහා නගර සභාව.

2026 මැයි මස 29 වැනි දින

| |
|---|
| |
| (කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා) |

**කළුතර මහා නගර සභාවේ ගිනි නිවීම් සේවා ඒකකයෙහි ගිනිභට තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026**

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය : ☐ (සිංහල -S, දෙමළ- T)

01.. (i) මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල්අකුරෙන්) :..............................................................................................................................................................................................................................................................................
(උදා - PERERA A.B.C.)

(ii) මුලකුරුවලින් කියවෙන නම් (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ..................................................................................................................................................................................................................................

.

(iii) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :...............................................................................................................................................................................................................................................

02. (i) ස්ථිර පදිංචි ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :.........................................................................................................................................................................................................................

(ii) ස්ථිර පදිංචි ලිපිනය (සිංහලෙන්/ දෙමළෙන්) : .........................................................................................................................................................................................................................

(iii) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය : ................................................................................................................................................................................................................................................

(vi) බස්නාහිර පලාත තුළ පදිංචි කවදා සිට ද : .................................................................................................................

03. (i) ස්ත්‍රී / පුරුෂ භාවය : ☐ (ස්ත්‍රී - F, පුරුෂ - M)

(ii) ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

(iii) විවාහක/අවිවාහක : ☐ (විවාහක - M, අවිවාහක -S)

(iv) දුරකථන අංකය : ...................................................................

(v) වට්ස්ඇප් අංකය : ....................................................................

(vi) උපන් දිනය : අවුරුද්ද :..................... මාසය : ........................... දිනය :...........................

(vii) **2026.06.19** දිනට වයස : අවුරුදු :.......................... මාස : ........................... දින :...........................

(viii) ජාතිය : …………………………………… ආගම :………………………………………

(ix) උස : අඩි.............................අඟල්.............................

(x) ජෛව ස්කන්ධ දර්ශකය:..............................

**04. අධ්‍යාපන සුදුසුකම් :**

(i) අ.පො.ස.(සා.පෙළ) විභාගය

විභාගයට පෙනී සිටි වර්ෂය - ............මාසය.........
විභාග අංකය - .......................

| අනු. අංකය | විෂයය | සාමාර්ථය |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

විභාගයට පෙනී සිටි වර්ෂය - ............මාසය..........
විභාග අංකය - .......................

| අනු. අංකය | විෂයය | සාමාර්ථය |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

5. (i) ඔබ කිසියම් සාපරාධි වරදකට උසාවියකින් දඬුවම් ලබා තිබේද ?ඔව්/නැත.......................................................
(ii) ඔව් නම් විස්තර කරන්න ......................................................................................................................
.......................................................................................................................................................

6. අයදුම්කරු දැනට රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ රැකියාවක් කරන්නේනම් ,

i. දැනට දරන තනතුර ..............................................................................................................
ii. එම තනතුරට පත්වූ දිනය ...................................................................................................
iii. සේවා ස්ථානයේ නම හා ලිපිනය .......................................................................................
iv. සේවා ස්ථානයේ දුරකථන අංකය.........................................................................................

**7. අයදුම්කරුගේ සහතිකය :**

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම් පිළිබඳව පනවා ඇති කොන්දේසි අනුව ම'විසින් සාවද්‍ය තොරතුරක් දක්වා ඇතොත් විභාගයට පෙර හෝ පසුව හෝ මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කළ හැකි බවත් තෝරාගැනීමෙන් පසුව ඒ බැව් හෙලිවුවහොත් සේවයෙන් පහ කිරීමට යටත්වන බවත් දනිමි.

දිනය : ...........................

.............................................
අයදුම්කරුගේ අත්සන.

08. **අත්සන සහතික කිරීම :**

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ..........................................................................................මහතා මා පුද්ගලිකව දන්නා බවද, ඔහු මා ඉදිරිපිට දී ඔහුගේ අත්සන තැබූ බවත් මෙයින් සහතික කරමි.

නම : ....................................................................
අත්සන : ....................................................................
දිනය : ....................................................................
නිල මුද්‍රාව : ....................................................................

(මෙම සහතිකය රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු/සාමදාන විනිශ්චයකාරවරයකු/දිවුරුම් කොමසාරිස්වරයකු/ප්‍රසිද්ධ නොතාරිස්වරයකු/ත්‍රිවිධ හමුදාවේ බලයලත් නිලධාරියකු/පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියකු හෝ / රු. 395,520.00 ක් හෝ ඊට වැඩි වාර්ෂික වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.)

09. **දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

මෙම අයදුම්කරු වන .......................................................................................................................................... මයා..... ............................................වශයෙන්................................. දින සිට......................................... ............................ ...................................................... හි සේවය කරන බවත්, මෙම අයදුම්පතෙහි සපයා ඇති සියලුම තොරතුරු ඔහුගේ පෞද්ගලික ලිපි ගොනුව අනුව සැසඳෙන බවත්/ඒවා නිවැරදි බවත් මෙයින් සහතික කරමි.

නම : ...........................................................................

අත්සන : ...........................................................................

දිනය : ...........................................................................

නිල මුද්‍රාව : ...........................................................................

05-365

---

# පළාත් පාලන නිවේදන

## මාවනැල්ල ප්‍රාදේශීය සභාව

### ගව ඝාතකාගාරයක් සඳහා බලපත්‍ර ලබා දීම සම්බන්ධයෙන් විරෝධතා කැඳවීම

ස්ථානය : බෝවැල්ල පාර, ඇලහිල්ලෑව වත්ත, දනාගම, මාවනැල්ල

අයදුම්කරුගේ නම : එම්. එම්. අල්තාෆ් මයා

අයදුම්කරුගේ ලිපිනය : අංක 88/35, කිරිංගදෙණිය, කෝසාමුල්ල, මාවනැල්ල

ඉහත නම් සඳහන් අයදුම්කරු 1893 අංක 09 දරන ගෝඝාතක ආඥාපනතේ 11 පරිච්ඡේදයේ (2) වගන්තිය ප්‍රකාරව අයදුම්පතක් මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ සභාපති වන මා වෙත ඉදිරිපත් කර, ගව ඝාතකාගාරයක් ඉහත සඳහන් ස්ථානයේ ආරම්භ කිරීමට අනුමැතිය ඉල්ලා ඇත.

එම ස්ථානයේ ගව ඝාතකාගාරය පවත්වාගෙන යාමට බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධව බල ප්‍රදේශයේ පදිංචිකරුවන් වන ඔබට යම් විරුද්ධතාවයකට කරුණු තිබේ නම්, ඒ පිළිබඳ ලිඛිත ප්‍රකාශයක් පිටපත් දෙකකින් (02) යුක්තව මෙම ගැසට් නිවේදනය සිට දින 21 ක් ඇතුළත මා වෙත ඉදිරිපත් කළ යුතු බව ඉහත කී ආඥාපනතේ 1 පරිච්ඡේදයේ 7(2) (ආ) වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කරමි.

යූ. පුතුල උඩගම,
සභාපති,
මාවනැල්ල ප්‍රාදේශීය සභාව.

2026 මැයි මස 11 දින.

05-372

---

## කාත්තන්කුඩි නගර සභාව

### නගර සභා ආඥාපනතේ 255 අධිකාරයේ 41 සිට 45 දක්වා වගන්තිය මහජන අවශ්‍යතා සඳහා ඉඩම් හෝ ගොඩනැගිලි අත්පත් කර ගැනීම

කාත්තන්කුඩි නගර සභා බල ප්‍රදේශය තුළ නව කාත්තන්කුඩි 167/B ග්‍රාම සේවා වසමේ පිහිටි මධ්‍ය මහා විද්‍යාලයේ (ජාතික පාසල) උතුරු දෙසට තාප්පයට එපිට එනම් නැගෙනහිරට නේවාසිකාගාර මාර්ගය, බස්නාහිරට කර්බලා මාර්ගය, උතුරට ආචාර්ය බදියුදීන් මහමූද් මාවත, දකුණට රාජ්‍ය ඉඩමය.

මෙම ඉඩම්වල පිහිටා ඇති පාසලේ ප්‍රධාන පිවිසුමේ විශාලත්වය මීටර් 10.4 ක් වන මාර්ගයද, ඉර්ෂාද් පල්ලියට මීටර් 3ක විශාලත්වයකින් යුතු පාර සහ අනෙකුත් ආයතන සඳහා පාරක් ලෙස වෙන්කර ඉතිරිව ඇති ඉහත සඳහන් මායිමේ පිහිටි ඉඩම් හා දේපළ සියල්ල නගර සභාවේ ආඥාපනතේ 255 අධිකාරයේ 41-45 වගන්තිය යටතේ මහජන සංවර්ධන කටයුතු සඳහා නගර සභාව විසින් පවරාගෙන ඇති බව මහජනතාවට දැනුම් දෙනු ලැබේ.

එස්. එච්. එම්. අස්ෆර් ජේපී යූඑම්,
සභාපති,
නගර සභාව,
කාත්තන්කුඩි.

05-405

---

**මාතර මහා නගර සභාව**

**දක්ෂිණ ප්‍රභා වෙසක් කලාපය සඳහා මාර්ග වසා තැබීම**

ශ්‍රී ලංකා නීති ප්‍රඥප්ති සංග්‍රහයේ 252 අධිකාරය යටතේ මහ නගර සභා ආඥාපනත මගින් මා වෙත පැවරී ඇති බලතල අනුව, 2017 මාර්තු 03 දිනැති අංක 2009 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කර ප්‍රසිද්ධියට පත් කර, මාතර මහා නගර සභාව විසින් වැළඳගන්නා ලද, දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යවරයා විසින් කෙටුම්පත් කර ප්‍රසිද්ධියට පත් කරන ලද අංක 1811 හා 2013 මැයි 17 දින දරන ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ වාහන නතර කිරීම හා වාහන හැසිරවීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ 2 වගන්තිය ප්‍රකාරව, මෙවර ජාතික වෙසක් උත්සවයට සමගාමීව මාතර නගරයේ පැවැත්වෙන දක්ෂිණා ප්‍රභා වෙසක් කලාපය සංවිධාන කටයුතු සඳහා 2026.05.22 දින සිට 2026.06.03 දින දක්වා මාතර වටරවුම අසල ඇති පිළිරුවේ සිට බ්‍රවුන්ස් හිල් දක්වා වූ වෙරළ පාරේ වම්පස මං තීරුව පමණක් ද, 2026.05.30 දින සිට 2026.06.01 දින දක්වා එම මාර්ගය සම්පූර්ණයෙන් ද, රථ වාහන ධාවනය වලකාලමින් වසා තබනු ලබන බව මෙයින් නිවේදනය කර ප්‍රසිද්ධ කරමි.

ජයන්ත කේ. එස්. පතිරණ,
නගරාධිපති,
මාතර මහා නගර සභාව.

2026 මැයි මස 21 දින,
මාතර මහා නගර සභා කාර්යාලයේ දී ය.

05-420

---

## විවිධ දැන්වීම්

සංශෝධනයයි

**ඇල්පිටිය ප්‍රාදේශීය සභාව**

2026 වර්ෂය සඳහා ගාස්තු පැනවීම සම්බන්ධයෙන් මා විසින් 2025.11.28 දින පළ කරන ලද *ගැසට්* නිවේදනයේ යෝජනා අංකය ඉදිරියෙන් 2026 ඔක්තෝබර් මස 08 දින යනුවෙන් සඳහන් සියලුම ස්ථානයන්හි දිනය 2025 ඔක්තෝබර් මස 08 දින යනුවෙන් සංශෝධනය කරනු ලබන බව මහජනතාව වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

තවද මෙය 2026 ජනවාරි මස සිට බල පැවැත්වෙන බවද නිවේදනය කරනු ලැබේ.

එල්. එල්. සනත් ප්‍රියන්ත සුමනසිරි,
සභාපති,
ඇල්පිටිය ප්‍රාදේශීය සභාව.

05-363

**මිහින්තලේ ප්‍රාදේශීය සභාව**

2026 වර්ෂය සඳහා වෙනත් ගාස්තු පැනවීම (සංශෝධනය)

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් සම්මත අතුරු ව්‍යවස්ථාවෙන් වෙනත් පනත් හා නීති/රීති හා චක්‍රලේඛන මගින් මිහින්තලේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල හා කාර්යය ක්‍රියාත්මක කිරීමේ දී ඉටු කරනු ලබන පහත සඳහන් පොදු උපයෝගීතා සේවා, සුහසාධක සේවා යන වෙනත් බලතල ක්‍රියාවට නැංවීමේ දී අවශ්‍ය කරන සේවා සැපයීමේ දී 2026 වර්ෂය ඇතුළත ප්‍රාදේශීය සභා අරමුදලට අයකර ගත යුතු යැයි, 2025.12.26 ගැසට් පත්‍ර අංක 2,470 යටතේ පළ කරන ලද පහත ගාස්තු මෙහි උපලේඛනයේ සඳහන් ආකාරයට සංශෝධනය විය යුතු යැයි 2026.03.10 දින මහා සභා තීරණ අංක 2026/39 යටතේ තීරණය ගෙන ඇති බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

වයි. ජී. ධර්මදාස,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
මිහින්තලේ.

2026 වර්ෂයෙහි මාර්තු මස 10 දින,
මිහින්තලේ ප්‍රාදේශීය සභාව,
මිහින්තලේ.

**උපලේඛනය**

| *අනු. අංකය* | *ගාස්තු විස්තරය* | *2026 වර්ෂයට අය කරන මුදල (රු.) 2025.12.26 දින 2470 ගැසට් පත්‍රයේ සඳහන් වූ ගාස්තුව* | *2026.03.10 දින සිට සංශෝධන ගාස්තුව (රු.)* |
|---|---|---|---|
| 01. | බොරළු/පස්/ගල් ප්‍රවාහනය කිරීම සඳහා ප්‍රාදේශීය සභාව සතු මාර්ග භාවිතා කිරීම වෙනුවෙන් ගාස්තු අය කිරීම (කියුබ් 600 ක් දක්වා කියුබ් 01 ක් සඳහා) | 200.00 | 150.00 |
| 02. | බොරළු/පස්/ගල් ප්‍රවාහනය කිරීම සඳහා ප්‍රාදේශීය සභාව සතු මාර්ග භාවිතා කිරීම වෙනුවෙන් ගාස්තු අය කිරීම (කියුබ් 600ට වැඩි කියුබ් 01 ක් සඳහා) | 300.00 | 150.00 |
| 03. | බොරළු/පස්/ගල් ප්‍රවාහනය කිරීම සඳහා ප්‍රාදේශීය සභාව සතු මාර්ග භාවිතා කිරීම වෙනුවෙන් ගාස්තු අය කිරීම (බල ප්‍රදේශයෙන් පිට ස්ථානයක සිට බොරළු ප්‍රවාහනයේ දී කියුබ් 01 ක් සඳහා) | 400.00 | 150.00 |

05-351

---

**මහර ප්‍රාදේශීය සභාව**

2026 වර්ෂයට ක්‍රීඩා භූමි පරිහරණය සඳහා ගාස්තු පැනවීම

කේ. ඒ. අතුල ජයන්ත් වන මහර ප්‍රාදේශීය සභාවේ සභාපති වන මා විසින් 2025.12.12 දින අංක 2467 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ 2026 වර්ෂය සඳහා බදු පැනවීම යටතේ පළ කරන ලද ක්‍රීඩා භූමි පරිහරණය සඳහා ගාස්තු පැනවීම යටතේ වන උපලේඛනයේ අංක 01 හි සඳහන් මල්වතුහිරිපිටිය ක්‍රීඩාංගනය පරිහරණය කිරීමේ තැන්පතු මුදල වශයෙන් අය කරන රු. 5,000.00 ක මුදල ඉදිරියේ දී අය නොකිරීම, 2026.02.10 දින යෝජනා අංක (ඊ) (අ) 01 යටතේ ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කරමි.

සභාපති,
මහර ප්‍රාදේශීය සභාව.

05-397

**ගම්පොල නගර සභාව**

ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තු - 2026

ගම්පොල නගර සභා බල ප්‍රදේශය තුළ ප්‍රදර්ශනය කරනු ලබන දැන්වීම් පුවරු වෙනුවෙන් 2026 වර්ෂය සඳහා 2025 ඔක්තෝබර් මස 07 දින පවත්වන ලද මාසික මහා සභාවේ තීරණ අංක එ 01.29 අනුව තීරණය කර 2025.12.12 දින අංක 2467 යටතේ ගැසට් පත්‍ර යේ පළ කර ඇති ගාස්තු පහත පරිදි සංශෝධනය කර ප්‍රදර්ශන ගාස්තුවක් පනවා අය කිරීමට ගම්පොළ නගර සභාව විසින්, 2026 මැයි මස 14 දින පවත්වන ලද මාසික මහ සභා තීරණ අංක එ 01.47 යටතේ තීරණය කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. එම්. පී. ඉරුක මිහිරාන් වීරරත්න,
සභාපති,
ගම්පොළ නගර සභාව.

2026 මැයි මස 18 දින,
ගම්පොළ නගර සභා ශාලාවේ දී ය.

**යෝජනාව**

ගම්පොළ නගර සභා බල ප්‍රදේශය තුළ ප්‍රදර්ශනය කරනු ලබන වෙළඳ ප්‍රචාරක දැන්වීම් සඳහා පහත සඳහන් ආකාරයට සංශෝධිත දැන්වීම් පුවරු ගාස්තුවක් 2026 වර්ෂයට පනවා අය කිරීමට ගම්පොළ නගර සභාව යෝජනා කරන්නීය.

**ප්‍රචාරක දැන්වීම්**

01. රෙදි ඉටිරෙදි බැනරයක් ප්‍රදර්ශනය සඳහා

| | | *රු. ශත* |
|---|---|---|
| 1. | දින 03 ක් සඳහා (ව. අ. 01) | 1,500.00 |
| 2. | දින 03 - 07 සඳහා (ව. අ. 01) | 2,000.00 |
| 3. | දින 07 - 14 සඳහා (ව.අ. 01)<br>(උපරිම කාලය සති 02) | 3,000.00 |

02. බිත්තියක පුවරු ඇඳීම

| | | |
|---|---|---|
| 1. | වර්ෂයක් සඳහා (ව.අ. 01) | 1,000.00 |

03. ස්ථිර වෙළඳ ප්‍රචාරණ දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම

| | | |
|---|---|---|
| 1. | වර්ෂයක් සඳහා (ව.අ. 01) | 3,000.00 |

04. ප්‍රතිදීප්ත ප්‍රචාරණ පුවරුවක් ප්‍රදර්ශනය සඳහා

| | | |
|---|---|---|
| 1. | වර්ෂයක් සඳහා (ව.අ. 01) | 3,000.00 |

05. නගර සභාව සතු ඉඩම් හා මාර්ග ආශ්‍රිතව ප්‍රචාරක දැන්වීම් සහ ස්ථිර දැන්වීම් පුවරු සවි කිරීමට අවසර ලබා දීම වෙනුවෙන් බිම් කුලිය ලෙස දික් අඩියක් සඳහා වාර්ෂික ගාස්තුව රු. 3,000.00 කි.

**කොන්දේසි**

01. ව්‍යාපාරික ස්ථානවල ප්‍රදර්ශනයේ පවතින ස්ථිර දැන්වීම් පුවරු ගාස්තු අය කිරීමේ දී ප්‍රදර්ශනයේ පවතින්නේ එක් දැන්වීම් පුවරුවක් පමණක් වනවිට වර්ග අඩි 10 ක ප්‍රමාණයක් නිදහස් කර ඉතිරි ප්‍රමාණයට වර්ග අඩියකට රු. 100.00 බැගින් අය කිරීම.

02. දැන්වීම් පුවරු 02 ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ප්‍රදර්ශනය කරන විට එම දැන්වීම් පුවරුවල වර්ග අඩියකට රු. 3000.00 බැගින් අය කිරීම

05-370/1

**ගම්පොල නගර සභාව**

ආගමික/පුද්ගලික උත්සව වෙනුවෙන් සිදු කරන ගව ඝාතනයන් සඳහා ගාස්තු - 2026

ගම්පොල නගර සභා බල ප්‍රදේශය තුළ ආගමික, පුද්ගලික උත්සව වෙනුවෙන් සිදු කරන ගවඝාතනයන් වෙනුවෙන් 2026 වර්ෂය සඳහා 2025 ඔක්තෝබර් මස 07 දින පවත්වන ලද මාසික මහ සභා තීරණ අංක එ 01.32 යටතේ පනවා 2025.12.12 දින අංක 2467 යටතේ *ගැසට්* පත්‍රයේ පළ කර ඇති ගාස්තු 2026 මැයි මස 14 දින පවත්වන ලද මාසික මහ සභාවේ තීරන අංක එ 01.47 යටතේ සංශෝධන කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. එම්. පී. ඉරුක මිහිරාන් වීරරත්න,
සභාපති,
ගම්පොළ නගර සභාව.

2026 මැයි මස 15 දින,
ගම්පොළ නගර සභා ශාලාවේ දී ය.

**යෝජනාව**

ගම්පොළ නගර සභා බල ප්‍රදේශය තුළ ආගමික/පුද්ගලික උත්සව වෙනුවෙන් සිදු කරන ගවඝාතනයන් සඳහා පහත සඳහන් ආකාරයට සංශෝධිත ගාස්තුවක් 2026 වර්ෂයට පනවා අය කිරීමට ගම්පොළ නගර සභාව යෝජනා කරන්නීය.

**ගව ඝාතන ගාස්තු**

| | *රු. ශත* |
|---|---|
| එක් ගවයෙක් සඳහා | 2,000.00 |

05-370/2